# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2051/38 - 2017 දෙසැම්බර් මස 29 වැනි සිකුරාදා - 2017.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන විෂයභාර අමාත්‍යවරයා වන්නාවූ, සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මා විසින්, 2014 ජුනි මස 16 දින අංක 1867/5 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* යටතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළකරන ලද නියමයට අතිරේකව තවදුරටත්, මෙම නියමය මගින් -

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාලසීමාව දීර්ඝ කිරීමේ අරමුණින් 2014 ජුනි මස 16 දින අංක 1867/5 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* යටතේ පළකරන ලද නියමයේ (4) වන වගන්තිය පහත දැක්වෙන ලෙස කියවෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''(4) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග පවතින ව්‍යාපෘති ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති දින සිට මාස අනූවක (90) කාලයක් ඇතුළත ඉහත කී ව්‍යාපෘතිය විසින් වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය.''

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

01 - 457

1A - PG 3851 — 407 (2018/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*